**බළන්ගොඩ නගර සභාව**

**2019-07-09 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව**

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2019.07.09**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රුමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 16. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |
| 17. ගරු නාගරික මන්ත්‍රී | අකිල එල්ලාවල මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

1. ලේකම් එස්. එච්. ඒ. කරුණාරත්න මිය

**01. පසුගිය සභාවේ සභා වාර්තාව හා සම්මත කිරීම.**

2019-07-09 වන දින මාසික මහ සභාවේ වැඩකටයුතු ආරම්භ කල ගරු සභාපතිතුමන් විසින්, 2019.06.11 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් 2019.06.11 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කල අතර ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

මෙදින සභා වාර්තාව සඳහා සංශෝධන තිබේදැයි ගරු සභාපතිතුමන් විමසා සිටි අවස්ථාවේ දී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රි එම්. ජුනයිදීන් මාලික්ෂා මැතිතුමන් විසින් සංශෝධනයන් ලෙස,

ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමා ඌරු මස් සඳහා කඩ කාමරයක් ලබාදීමේ යෝජනාව සම්බන්ධව අදහස් දැක්වීමේදී පැවසූ "ඌරු මස් කඩය සඳහා අත්දෙක ඔසවා ඡන්දය දෙන බව, හරක් මස් කඩයට යාබද කාමරයෙහි ඌරු මස් කඩයක් දැමුවද ගැටලුවක් නොවන බව හා 2011 වර්ෂයේදී මෙම යෝජනාව පැමිණි අවස්ථාවේ ගරු උප සභාපතිතුමා එයට විරුද්ධ නොවූයේ හිටපු සභාපතිතුමා ආරක්ෂා කිරීම සඳහා බව" සභා වාර්තාවේ සටහන් වී නොමැති බව පැවසීය.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා පවසා සිටියේ සභා වාර්තාවෙහි සභාවේ කථා කරන සියලු දේ ඇතුළත් නොකරන අතර අවශ්‍ය දේ පමණක් සංක්ෂිප්ත කර වාර්තා කරන බවයි. වැඩිදුරටත් අදහස් දැක්වූ සභාපතිතුමා මන්ත්‍රීවරුන් සභාවට ඉදිරිපත් කරන යෝජනා කිසිවක් වෙනස් නොකරන අතර මන්ත්‍රීවරුන් පවසන දෑ සංක්ෂිප්ත කර වාර්තා කරන බව පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් ධීවර සංස්ථාව සඳහා කඩ කාමරයක් ලබා දීම යෝජනාව සඳහා ඡන්දය විමසීමට හේතුව පොදු වෙළෙඳසැල තුළ හා පොදු වෙළෙඳසැලෙන් බාහිර ස්ථානයක දැමීම සුදුසු බව යනුවෙන් මත දෙකක් තිබීම බවත්, නමුත් එය සටහන් වී නොමැති බවත් පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා විසින් අදහස් දක්වමින් ඌරු මස් කඩයක් ආරම්භ කිරීම සඳහා කඩ කාමරයක් ලබා දීම හා ධීවර සංස්ථාව සඳහා කඩ කාමරයක් ලබා දීම වෙනුවෙන් ඡන්දයක් විමසීම සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කළ නමුත් එය සභා වාර්තාවේ සටහන් වී නොමැති බව පැවසීය.

**ඒ අනුව ඉහත සංශෝධනයන්ට යටත්ව සභා වාර්තාව සභා සම්මත විය.**

ඩයලොග් ආයතනයේ නිලධාරියෙකු ඩයලොග් සිම්පත් ගැන දැනුවත් කිරීම සඳහා පැමිණ සිටි බැවින් මෙහිදී ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමියගේ යෝජනා ස්ථීරත්වයෙන් සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් කරන ලද අතර, එම දැනුවත් කිරීමෙන් පසුව ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් හා ගරු උප සභාපතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- සභා කටයුතු පවත්වාගෙන යාම සඳහා ඉතා සීමිත කාලයක් පවතින බැවින් කාලය කළමණාකරණය කරගනිමින් සභාව පවත්වාගෙන යන ලෙසත්, සභාව සම්බන්ධ නීති රීති, රෙගුලාසි හා චක්‍රලේඛ අනුව සභාවේ කටයුතු කරගෙන යා යුතු බවත් පැවසීය. එමෙන්ම මන්ත්‍රීවරයෙකු වශයෙන් සභාවේදී හැසිරිය යුත්තේ කුමන ආකාරයකින්ද යෝජනා ඉදිරිපත් කළ යුත්තේ කෙසේද, ඒවාට පිළිතුරු සැපයිය යුතුතේ කෙසේද, එක් සභිකයෙකු කථා කිරීමේදී අන් සභිකයන් හැසිරිය යුත්තේ කෙසේද යන්න දැනුවත් වී සභාවට සම්බන්ධ වන ලෙසත්, ප්‍රදේශයේ මහජනතාවගේ සුභ සිද්ධිය වෙනුවෙන් කටයුතු කිරීමට වගබලා ගන්නා ලෙසත් වැඩිදුරටත් පැවසීය.

- බළන්ගොඩ නගර සභාව මඟින් පොසොන් පොහොය නිමිති කරගනිමින් පැවැත්වූ ශීල ව්‍යාපාර වැඩසටහන ඉතා සාර්ථක අයුරින් පැවැත්වූ අතර ඒ සඳහා සහභාගි වූ මන්ත්‍රී මණ්ඩලයට හා ලේකම්තුමිය ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලයට තමන්ගේ ස්තුතිය පුද කර සිටින බව පැවසීය.

- පොසොන් පොහොය නිමිති කරගෙන පැවැත්වූ බොදු බැති ගී සැඳෑව සාර්ථක අන්දමින් පැවැත්වූ අතර ඒ සඳහා සහයෝගය ලබා දුන් රාජ්‍ය හා පුද්ගලික ආයතන, මොහාන් සාලිය එල්ලාවල පදනම, ආදි ශිෂ්‍ය එකමුතුව, බළන්ගොඩ තරුණ කැළ, වෙළෙඳ ප්‍රජාව හා මන්ත්‍රී මණ්ඩලයේ සියලු දෙනා සඳහා බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා, මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුලු සමස්ථ කාර්ය මණ්ඩලයේ ස්තුතිය පළ කර සිටින ලදී.

**03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම.**

- **නගර සභාවට අයත් මාර්ගයක් නගර වාසීන්ට පරිහරණයට කිරීමට ඉඩ නොදී එක් පවුලක පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීම.**

  බාන්ස් රත්වත්ත මාවතේ කාර්ගිල්ස් ආයතනය ඉදිරිපිට බදුල්ල බස්නැවතුමට දකුණු පසින් වූ මාර්ගය කොන්ක්‍රීට් ගල් අතුරා පුළුල් කර ජනතා අයිතියට පත්කර ඇතත් මේ වන විට එම මාර්ගය අනුලා සමරජීවට අයත් පවුල විසින් නගර වාසින්ට ප්‍රයෝජනයට ගැනීමට ඉඩ නොදී පෞද්ගලිකව පරිහරණය කරන බව පවසමින් බලගහමුල ප්‍රදේශවාසීන් විසින් එවා තිබූ පෙත්සම සභාපතිතුමා විසින් සභාගත කරන ලදී. මෙහි ගමන් ගන්නා මගීන්ට හා වාහන වලටද ඉතා පහත් ආකාරයට

බැන වදින අතර බදුල්ල බස් නැවතුම්පල මගීන්ටද බැණ වදින අවස්ථා දක්නට ලැබෙන බැවින් මෙම තත්වයන් සළකා බලා ප්‍රදේශවාසී සැමගේ ආරක්ෂාව තහවුරු කොට දෙන ලෙසත්, මේ පිළිබඳව පූර්ණ පරීක්ෂණයක් සිදු කොට නැවතත් මාර්ගයට සුදුසු නමක් හා නාම පුවරුවක් යොදන ලෙසත් එහි වැඩිදුරටත් සඳහන් විය.

මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විමසා සිටියේ මෙම මාර්ගය නගර සභාවට පවරා ගෙන ඇත්දැයි යන්නයි. තමන්ගේ පාලන සමයේදී මෙම මාර්ගය පුද්ගලිකව සාදා දුන් පාරක් වන අතර මෙම මාර්ගය සභා අරමුදලින් නොව අතුළ කුමාර රාහුබද්ධ මැතිතුමාගේ ප්‍රතිපාදන මත පළාත් සභා අරමුදලින් සාදා දුන් බව පැවසීය. සභා අරමුදල් යොදවා මාර්ග සංවර්ධනය කරන්නේ නම් පමණක් නගර සභාව වෙත පවරා අදාළ සංවර්ධන කටයුතු කළ අතර වෙනත් අරමුදලක් යොදවා පාරවල් සදන්නේ නම් මුදල් ලැබුනු සැනින් එම කර්මාන්තය කරනවා මිස එම මාර්ගය පවරා ගැනීමට ඉක්මන් නොවන බැවින් සමහර මාර්ග පමණක් නගර සභාව වෙත පවරා ගෙන ඇති බව පැවසීය.

මෙහිදී අදහස් දක්වූ ගරු උප සභාපති ටී.එම්.ටී.රූමි මැතිතුමා පවසා සිටියේ ගැටළුවට අදාළ දෙපාර්ශවය කැඳවා මෙම ගැටළුව විසඳීම සුදුසු බවයි.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා පවසා සිටියේ මෙය පෞද්ගලික මට්ටමේ ගැටළුවක් බැවින් සභාවේදී මේ පිළිබඳ කථා කිරීම අවශ්‍ය නොවන බවයි.

මෙහිදී පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමන් පවසා සිටියේ නගර සභා ආඥා පනත අනුව නගර සභාව සීමාව තුළ පවතින මාර්ග නගර සභාව වෙත පවරා ගෙන තිබුණද එසේ නොමැති වුවද නගර සභාව සතුවන බවයි. එම නිසා අදාළ දෙපාර්ශවය කැඳවා සාකච්ඡාවක් කැඳවීම සුදුසු බව පැවසීය.

- **පදික කඩ අංක 185/10 දරණ කඩ කාමරයේ බදු අයිතිය පැවරීම.**

අංක 745/6, උඩකන්ද පාර, කරවිකැටිය, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි සම්පත් කුමාර මීගස්දෙණිය මහතා විසින් බළන්ගොඩ නගර සභාව සතු බස්නැවතුම්පළ ඉදිරිපිට පදික කඩ අංක 185/10 දරණ කඩ කාමරයේ බදු අයිතිය අංක 703 A, මුගුණමලය, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි දීපිකා පුෂ්ප කුමාරි විමලදේව යන අයට පැවරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා තිබූ ලිපිය සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

එහිදී අදහස් දක්වූ සභාපතිතුමන් විසින් 2018.09.13 දින පැවති මහ සභාවේ තීරණ අංක 04ඃ02ඃ21 යටතේ අනුමත වූ පරිදි පදික කඩ සඳහා නම් වෙනස් කිරීමේදී රු.50,000.00 ක පොදු ගාස්තුවක් අයකර දීපිකා පුෂ්ප කුමාරි විමලදේව යන අයට ඉහත අංක දරණ කඩ කාමරය පැවරීම සුදුසු බව පැවසීය.

**<u>ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා</u>**

- **මාර්ග උරහිස පළුදු කිරීමේ ගාස්තුවෙන් නිදහස් කිරීම.**

රාස්සගල පාර තානායම්වත්ත අතුරු මාර්ගයේ පදිංචි නිවැසියන් විසින් පොදුජල නළයක් මඟින් තම නිවාස වලට පානීය ජලය ලබා ගැනීමට සැලසුම් කර ඇති අතර එහිදී බළන්ගොඩ නගර සභාව වෙත අය කරනු ලබන මාර්ග උරහිස පළුදු කිරීමේ ගාස්තුව ඉවත්කර දෙන ලෙස ඉල්ලා සිටිමින් ඉදිරිපත් කළ ලිපිය ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

එහිදී අදහස් දක්වූ ගරු සභාපතිතුමා පවසා සිටියේ වැඩ අධිකාරි මහතාගේ අධීක්ෂණය යටතේ මාර්ගයට හානියක් නොවන ලෙස ජල නල එලා නැවත ප්‍රමිතියකට කාණුව වැසීම සිදු කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම සුදුසු බවයි.

- **සුනන්දාරාම මාවත ප්‍රතිසංස්කරණය කර ගැනීම**

සුනන්දාරාම මාවත ප්‍රතිසංස්කරණය කර ගැනීම සදහා අවධානය යොමු කරන ලෙස පවසමින් සුනන්දාරාම විහාරස්ථානයේ විහාරාධිපති හිමි ඉල්ලා සිටි ලිපිය ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී. එම ලිපියෙහි වැඩිදුරටත් සඳහන් වූයේ වැසි ජල කාණු පද්ධතිය ගොඩ වී ඇති අතර එහි පස් ඉවත් කර ජලය බැස යාමට හැකිවන සේ සකස් කර දූඩි ලෙස අබලන් වී ඇති මාර්ගයද ප්‍රතිසංස්කරණය කර දෙන ලෙසයි.

**<u>ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමා</u>**

බෝම්බුව පෙර පාසල් පාලිකාව විසින් මාසික දීමනාව රු.10,000.00 සිට රු.15,000.00 දක්වා වැඩි කර දෙන ලෙස ඉල්ලා සිටි ලිපිය ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

මෙහිදි සභාපතිතුමා පවසා සිටියේ ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බවයි. අදාළ අනුමැතිය ලබා ගැනීම සඳහා පළාත් සභාව වෙත ලිපි යවා ඇති අතර අනුමත වූ විගස අදාළ දීමනාව වැඩිකර හිඟ වැටුප සමඟ ගෙවන බව වැඩිදුරටත් පැවසීය.

**04. කල් දී ඇති ප්‍රශ්න**

**04ඃ01 ගරු නාගරික මන්ත්‍රිනි පී.කේ.එන්.ටී.ඩී.සමරසේකර මැතිතුමිය**

04ඃ01ඃ01 වීදි නාමකරණය යටතේ මියගිය පුද්ගලයෙකුගේ නමින් පමණක්ම මාර්ග නම් කරන ලෙස සඳහන් කර ඇති චක්‍රලේඛය පැහැදිලි කර දෙන්න.

මෙහිදී කරුණු පැහැදිලි කළ ගරු සභාපතිතුමන් 1975 අංක 04 දරණ වීථි නම් කිරීමේ සහ ස්මාරක පිහිටුවීම පාලනය කිරීමේ පනතට අනුව කටයුතු කිරීම යටතේ පළාත් පාලන කොමසාරිස් විසින් 1999.04.28 දිනැතිව නිකුත් කර ඇති උපදෙස් ප්‍රකාරව විශේෂ කරුණු හේතුකොට ගෙන මිස ජීවත්වන පුද්ගලයෙකුගේ නම් දැමීමෙන් හැකිතාක් දුරට වැළකිය යුතු යැයි දන්වා ඇති බව සභාපතිතුමා විසින් දැනුවත් කරන ලදී.

**05. කල් දී ඇති යෝජනා**

**05.01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා**

**05ඃ01ඃ01 සාප්පු සංකීර්ණය හා නිළ නිවාස ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා උපදේශන ගාස්තු වශයෙන් වැඩ වටිනාකමින් 4.5% ගෙවීමට අනුමැතිය ලබා ගැනීම.**

සාප්පු සංකීර්ණය හා නිළ නිවාස ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා උපදේශන ගාස්තු වශයෙන් වැඩ වටිනාකමින් 4.5% ගෙවීමට අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රි රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක් වූ ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමේදී ඇස්තමේන්තු හා සැලසුම් සකස් කර අනුමත කර දීම වෙනුවෙන් ඇස්තමේන්තු වැඩ වටිනාකමින් 2.5%ක්ද, කර්මාන්ත අධීක්ෂණය හා බිල්පත් සහතික කර ඉදිරිපත් කිරීම වෙනුවෙන් වැඩ වටිනාකමින් 2.0% ක්ද ගෙවීමට සිදුවන බවයි. ඒ අනුව සබරගමුව පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය වෙත උපදේශන සේවා අත්තිකාරම් මුදල් වශයෙන් රු.100,000.00 ක මුදලක් ගෙවීමට සිදුවන අතර සභාවට ලැබෙන මුද්දර ගාස්තු මගින් මෙම ගොඩනැගිල්ල ඉදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව වැඩිදුරටත් අදහස් දක්වමින් පවසා සිටියේය.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා පවසා සිටියේ අදාළ ආයතනයට එම ගාස්තු ගෙවීම අනිවාර්යය වන්නේ ඔවුන්ගේ දෛනික කටයුතු සිදු කරන්නේ එම මුදලින් නිසා බවයි. එමෙන් ම මෙම ගොඩනැගිල්ල ඉදි කිරීමේදී රථගාල සඳහා ඉඩ කඩ ප්‍රමාණවත් වන පරිදි වෙන්කර මාර්ගයෙන් පිටුපසට වන්නට ඉදිකරන ලෙසද පැවසීය.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05፥01፥02 සභාවේ දැක්ම වෙනස් කර නව දැක්මක් සකස් කිරීමට අනුමැතිය ලබා ගැනීම.**

සභාවේ දැක්ම වෙනස් කර නව දැක්මක් සකස් කිරීමට අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදි ගරු සභාපතිතුමා අදහස් දක්වමින් දැනට පවතින "2020 දී සුවපහසු දිවියකට තිරසර පුරවරක් " යන දැක්ම 2020 දී අවසන් වන බැවින් නව දැක්මක් වෙත යා යුතු බව පවසා සිටියේය.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා දැනට පවතින දැක්මෙහි ඉලක්ක ගත අරමුණු කොතරම් දුරට සපුරා ඇත්දැයි විමසා සිටියේය.

එහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙම සභාව වසර තුනක පමණ කාලයක් කොමසාරිස් පාලනය යටතේ පැවති අතර වත්මන් සභාව පත්වී වසර එක හමාරක වැනි කෙටි කාලයක් පමණක් ගත වී ඇති අතර එම නිසා වත්මන් දැක්ම 100% සාක්ෂාත් කර ගත නොහැකි වී ඇති නමුත් වර්තමානයේ පවත්නා අඩුපාඩු සකසා ගැනීමට හැකිවන පරිදි නව දැක්ම සකස් කිරීම සුදුසු බව පැවසීය.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05፥01፥03 බලංගොඩ නගර සභාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව ඉදිරිපත් කිරීම.**

බලංගොඩ නගර සභාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව ඉදිරිපත් කිරීමේ යෝජනාව සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමන් විසින් අදහස් දක්වමින් 2018.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය, මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවලින් සමන්විත වූ මූල්‍ය ප්‍රකාශය පිළිබඳ විගණනය කර ඇති බවත්, බළන්ගොඩ නගර සභාවේ මූල්‍ය තත්වය සහ එදිනට අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බවත් පැවසීය.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05ඃ01ඃ04 කසළ ට්‍රැක්ටරය ගමන් කිරීමට නොහැකි මාර්ගයන්හි කසළ එකතු කිරීම සඳහා "Bolero Truck" නැමති වාහනය මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.**

කසළ ට්‍රැක්ටරය ගමන් කිරීමට නොහැකි මාර්ගයන්හි කසළ එකතු කිරීම සඳහා "Bolero Truck" නැමති වාහනය මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රි රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් අදහස් දැක්වූ ගරු සභාපතිතුමා සභාවේ මූල්‍ය තත්වය සළකා "Truck" රථයක් මිළදී ගැනීමටත්, ඒ සඳහා පුවත්පත් දැන්වීමක් පළකිරීමකින් තොරව අදාළ නියෝජිත ආයතනයන්ගෙන් මිළ ගණන් කැඳවා මිළදී ගැනීමත් සුදුසු බව පැවසීය.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05ඃ01ඃ05 මහජන පොළ ටෙන්ඩර් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.**

මහජන පොළ ටෙන්ඩර් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රි රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමන් විසින් පවසා සිටියේ මහජන පොළ සභා නිළධාරීන් යොදවා ගෙන පවත්වාගෙන යාමේදී ගැටළු රාශියකට මුහුණ පාන අතර කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම, පොළ කටයුතු සඳහා යොදවන නිළධාරීන්ට අතිකාල දීමනා සහ දින වැටුප් ආදිය පියවීමේදී දරණ වියදමට සාපේක්ෂව ප්‍රමාණවත් ලාභයක් නොමැති වීම ආදිය ප්‍රධාන වශයෙන් පවතින ගැටළු බවයි. එමෙන්ම පොළ ටෙන්ඩර් කර ලබාදීම මඟින් සෑම මාසකටම ඒකාකාරී ආදායමක් ලැබෙන අතර, සභාවෙන් වියදමක් දැරීමට සිදු නොවන බව වැඩිදුරටත් අදහස් දක්වමින් පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්මින්** පවසා සිටියේ මහජන පොළ ටෙන්ඩර් කිරීම සම්බන්ධයෙන් තමා දැඩි විරෝධයක් දක්වන බවයි. මහජන පොළ සඳහා රුපියල් මිලියන 45 ක මුදලක් වැය කර ඇති අතර එම මුදල මේ වන විට ආදායම ලෙස ලබා ගෙන අවසන් බවත්, පොළ වෙළෙඳසැල් භාරකරු වශයෙන් සිටින නිළධාරිතුමා සම්බන්ධයෙන් ගැටළු පවතීනම් ඒ සඳහා

වෙනත් නිළධාරිවරයෙකු පත්කර ගනිමින් හෝ ක්ෂේත්‍ර නිළධාරින් යොදවා ගෙන මෙම කාර්යය ඉටු කිරීම සුදුසු බවත් පැවසීය.

වැඩිදුරටත් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රීතුමා මහජන පොළ ටෙන්ඩර් කිරීමෙන් වෙළෙඳුන් සඳහා අසාධාරණයක් වන අතර මහජන පොළ මඟින් සිදුවිය යුත්තේ පාරිභෝගිකයා සහ වෙළෙන්ඳාට ප්‍රතිලාභ ලබා ගැනීමට හැකිවිම බව පැවසීය. නගර සභාවට අයිති ඉරිදා පොළ රාජකාරි සිදු කරන නිළධාරින් සඳහා සඳුදා නිවාඩුවක් ලබා දි වියදම අවම කර ගත හැකි බවත් පැවසීය. එමෙන්ම පාරිභෝගිකයා හා වෙළෙන්දා යන දෙපිරිස පිළිබඳ අවධානය යොමු කරමින් මහජන පොළ ටෙන්ඩර් නොකරන ලෙසට දීර්ඝ වශයෙන් කරුණු පැහැදිලි කළේය. එමෙන්ම මහජන පොළ මේ වන විට ස්ථාන අටකට ගෙන ගොස් ඇති අතර දැනට පවතින මහජන පොළ භූමියේ අයිතිය නාගරික සංවර්ධන අධිකාරිය මඟින් නගර සභාව වෙත ලබා දී ඇති බැවින් එය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස දන්වීය.

මහජන පොළෙහි වත්මන් තත්වය පිළිබඳ කරුණු පැහැදිලි කිරීම සඳහා දැනට මහජන පොළ රාජකාරි සිදු කරන උපුල් නිශාන්ත කුමාර මහතා හා ආදායම් පරීක්ෂකවරු තිදෙනා සභාවට ගෙන්වූ බැවින් ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මන්ත්‍රීතුමියගේ යෝජනා ස්ථිරත්වයෙන් සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් කරන ලද අතර, එම දැනුවත් කිරීමෙන් පසුව ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් හා ගරු උප සභාපතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

අනතුරුව අදහස් දැක්වූ **ගරු නාගරික මන්ත්‍රී රවින්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා** මහජන පොළ ටෙන්ඩර් කළහොත් තොග හුවමාරුවේදී කිලෝ ග්‍රෑම් 01 ක් සඳහා රුපියල් 01 ක මුදලක් අය කරන බව චෝදනා කළ නමුත් එය දැනටත් සිදු වන අතර කාන්තා නිළධාරිනියන්ට පොළ කටයුතු සිදු කළ නොහැකි බව පැවසීය. සභාවට වෙළෙන්ඳන් රැගෙන එන එළවළු ප්‍රමාණය වැදගත් නොවන අතර එක් මඩුවකට රු.250.00ක මුදලක් අය කරමින් සභාවේ ආදායමත් සමඟ පොළ නිසි පරිදි කරගෙන යාම වන වැදගත් බැවින් මහජන පොළ ටෙන්ඩර් කිරීම සුදුසු බව වැඩිදුරටත් පැවසීය.

මෙහිදී අදහස් දැක්වූ **ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා** නගර සභාව යනු පාරිභෝගිකයින්ට සේවා සැපයිය යුතු ආයතනයක් වන අතර කසළ ටෙන්ඩරය, වැසිකිළි ටෙන්ඩරය ආදි ටෙන්ඩර් ගෙන ඒමේදී සභාපතිතුමා සමඟ සිටින බවත්, මහජන පොළ ටෙන්ඩර් කිරීමේදී කොතරම් කොන්දේසි එක් කර ටෙන්ඩර් කළද එය සාර්ථක නොවන බවත් පැවසීය.

එමෙන්ම මෙම යෝජනාව සම්බන්ධයෙන් අදාළ නිළධාරින්ද සභාවට කැඳවා සංවාදයකට ගිය අතර සභාවට යෝජනාවක් රැගෙන ආ විට යෝජනාවට විරුද්ධව

අදහස් පවතීනම් බෙදීමකට යාම සුදුසු බව පැවසීය. එබැවින් මෙම යෝජනාව සම්බන්ධයෙන් ඡන්දයකට යාම සුදුසු බව යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් එය ස්ථිර කළේය.

**ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා** අදහස් දක්වමින් පොළට පැමිණෙන සෑම පුද්ගලයෙක්ම වෙළෙන්දෙක් නොවන අතර සමහරු තමන් විසින් නිෂ්පාදනය කරන දේවල් රැගෙන පැමිණෙන නිෂ්පාදකයින් බවත්, සමහරු ඉතා කුඩා ප්‍රමාණයක් පමණක් රැගෙන එන බවත් පැවසීය. වැඩිදුරටත් අදහස් දක්වමින් එවැනි අවස්ථාවලදී දෙදෙනෙක් සඳහා එක් කඩ කාමරයක් ලබාදිය හැකි බව පැවසිය.

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා** අදහස් දක්වමින් මෙම වසරේ අප්‍රේල් මාසය වන තෙක් මසකට රු.400,000.00ට ආසන්න මුදලක් ලැබී ඇති අතර ඉන් පසු කාල සීමාව තුළ ආදායම අඩු වී ඇති බව පෙනෙන බැවින් 2019 අප්‍රේල් මාසය වන තෙක් මහජන පොළ කටයුතු සිදු කළ නිළධාරීන්ම යොදවා කටයුතු කිරීම සුදුසු බව පැවසීය.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මේ පිළිබඳව ඡන්දයකට යාම අනවශ්‍ය බවත්, දෙසැම්බර් මාසය වන තෙක් මේ අයුරින්ම පවත්වාගෙන යාම සුදුසු බවත් පැවසීය. මහජන නියෝජිතයින් මෙන් නොව සභාවේ සභාපතිතුමා, ලේකම් ඇතුළු නිළධාරි පිරිස සභාවේ ආදායම අඩුවීමට වගකිවයුතු අතර සභාවේ පරිපාලන කටයුතු, නඩත්තු කටයුතු, ණය වාරික ගෙවීම ආදිය සඳහා මුදල් අවශ්‍ය බව වැඩි දුරටත් අදහස් දක්වමින් පැවසීය.

**05:01:06 පොදු වෙළෙඳසැල ඉදිකිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.**

පොදු වෙළෙඳසැල ඉදිකිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

## 06. මන්ත්‍රී යෝජනා

### 06:01 ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය

**06:01:01** බළන්ගොඩ නගරය තුළ ත්‍රී වීලර් රථ නවතා තැබීම සම්බන්ධව විධිමත් ක්‍රියාමාර්ගයක් ගැනීම.

**06:01:02** නගර සභාවේ දූනට තිබෙන බුදු මැදුර පිළිසකර කිරීම හෝ වෙනත් ස්ථානයක (මුර කුටිය අසල) ස්ථාපනය කිරීම.

**06:01:03** බස් නැවතුම්පල ඉහළ මහලේ නොයෙක් අපචාර සිදුවන හෙයින් පොලිස් මුරකුටිය නැවතත් ස්ථාපනය කිරීම.

**06:01:04** පෞද්ගලික පංති සඳහා සහභාගි වන දරුවන් පංතිවලට නොයා නොයෙක් අයථා වැඩ සඳහා යොමු වී ඇත. එබැවින් අදාල ආයතන දැනුවත් කිරීම.

**06:01:05** සී.සී.දෙමළ විද්‍යාලීය දරුවන්ට පාසල නිම වීමෙන් පසුව පාරට ඒමට නොහැකි ලෙස ත්‍රීවීලර් හා වෙනත් වාහන තැබීම හේතුවෙන් මහත් කරදර වලට මුහුණ පෑමට සිදු වී ඇත. මගී ජනතාවටද එම වේලාව මහත් කරදරයක් වී ඇත. මේ සම්බන්ධව යම් ක්‍රියා මාර්ගයක් ගැනීම.

ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රි පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් අදහස් දක්වමින් පසුගිය අප්‍රේල් මස සිදු වූ බෝම්බ ප්‍රහාරයත් සමඟ බළන්ගොඩ නගරයට පැමිණෙන ජනතාවද අඩු වූ අතර එසේ පැමිණි ජනතාවටද ත්‍රීවිල් රියදුරන්ගෙන් විවිධ ප්‍රශ්නවලට මුහුණ පෑමට සිදු වූ බව පැවසීය. එමෙන්ම වෙළෙඳසැලකට යාමට ද නොහැකි වන පරිදි ත්‍රී රෝද රථ නතර කර තැබීම, නගරයට පැමිණෙන ත්‍රී රෝද රථ නගරයේ සෑම තැනකම නතර කර තැබීම බළන්ගොඩ කඩ හිමියන් ඔවුන්ගේ ත්‍රීරෝද රථ තම වෙළෙඳසැළ ඉදිරිපිට උදේ සිට හවස් වන තුරුම නතර කරන අවස්ථා දක්නට ලැබීම ආදි ගැටළු දක්නට ඇති බව පැවසීය. එබැවින් මොවුන් සඳහා නිශ්චිත ස්ථානයක් වෙන් කර ලබා දීමට නොහැකිද යන්න මන්ත්‍රීතුමිය විසින් විමසා සිටින ලදී.

එමෙන්ම නගර සභාවේ දැනට පවතින බුදු මැදුර ආවරණය වී ඇති බවත්, එහි වහළ සම්පූර්ණයෙන්ම අබලන් වී ඇති බවත් පැවසීය. එබැවින් ආයතනයට පිවිසෙන විටම පෙනෙන පරිදි වෙනත් ස්ථානයක බුදු මැදුර ස්ථාපිත කිරීමට හැකිනම් එය වඩාත් සුදුසු බව පැවසීය.

තමන් බස්නැවතුම් පොළ ඉහළ මාලයට ගිය අවස්ථාවේදී පාසල් යන වයසේ තරුණ පිරිමි දරුවන් මත්ද්‍රව්‍ය පාවිච්චි කර විකෘති සිහියකින් සිටින අයුරු හා පාසල් යන ගැහැනු, පිරිමි දරුවන් අසංවරව හැසිරෙන අයුරු දැකීමට ලැබුණු අතර දැයේ දරුවන් විනාශමුඛයට යන මෙම ක්‍රියාවෙන් වැළැක්වීම සඳහා පෙර තිබූ ස්ථානයේ පොළිස් මුරපොළ නැවත ස්ථාපිත කිරීමත්, මේ පිළිබඳව පාසල් පද්ධතිය දැනුවත් කිරීමත් සුදුසු බව පැවසීය.

එමෙන්ම පෞද්ගලික පංති වලට පැමිණෙන දරුවන් උදේ නිවසින් පිටවී ගොස් සවස නිවසට පැමිණෙන අතර දෙමාපියන්ටද ඔවුන්ගේ කාර්ය බහුලත්වයත් සමඟ

නිතරම දරුවන් ගැන සොයා බැලීමට ඉඩ නොලැබෙන අතර උපකාරක පංති පවත්වන ගුරුවරුන් මුදල් පදනම මත පමණක් පංති පවත්වන බව පැවසීය. එබැවින් පංති වලට පැමිණෙන දරුවන් පංති වලට නොයා සිටින අතර බොහෝ දින වල දෙවට පාරේ අශෝබන ලෙස හැසිරෙන අයුරු දක්නට ඇති බව පැවසීය. එම නිසා පංති පවත්වන අදාළ ආයතන දැනුවත් කිරීමට හැකියාවක් පවතීනම් එය වඩාත් සුදුසු බව පැවසීය.

වැඩිදුරටත් අදහස් දක්වමින් සී.සී.දෙමළ විද්‍යාලීය දරුවන්ට පාසල නිම වීමෙන් පසුව පාරට ඒමට නොහැකි ලෙස ත්‍රීවීලර් හා වෙනත් වාහන නවතා තැබීම හේතුවෙන් මහත් කරදර වලට මුහුණ පෑමට සිදු වී ඇති අතර හැම පැත්තෙන්ම වාහන පැමිණීම නිසා මගී ජනතාවටද එම වේලාව මහත් කරදරයක් වී ඇති බවත්, පාසල් නිමවන වෙලාවේ පැයක පමණ කාලයකට හෝ මෙහි පැමිණෙන වාහන අතුරු මාර්ග වල නතර කිරීමට හැකිනම් මේ සම්බන්ධව යම් ක්‍රියා මාර්ගයක් ගැනීම සුදුසු බවත් පැවසීය.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා පවසා සිටියේ දැනට ස්ථාපිත කර ඇති බුදු මැදුර එම්.එස්.ශ්‍රියානි චන්ද්‍රරත්න මහත්මියගේ පරිත්‍යාගයක් වන නිසා මෙය වෙනස් කරන්නේනම් ඇය දැනුවත් කරන ලෙසයි.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා පවසා සිටියේ බස් නැවතුපලට පොලිස් ආරක්ෂාව ලබා දීම අනිවාර්යය වන අතර, නගර සභාව වශයෙන් අපි තරුණ තරුණියන්ගේ අවශ්‍යතා පිළිබඳව සැලකිලිමත් විය යුතු අතර නැතහොත් මීට වඩා ප්‍රශ්න වලට මුහුණ දිය හැකි බවයි. එම නිසා තුරු උයන සංවර්ධනය කිරීම හෝ වෙනත් උද්‍යානයක් ස්ථාපනය කිරීම සුදුසු බව පැවසීය.

මෙහිදී පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා පවසා සිටියේ අද සමාජ ජාලා ආදිය හේතුකොට ගෙන සමාජය පිරිහී ගොස් ඇති අතර, රු.30,000,000.00 ක පමණ ව්‍යාපෘතියක් සඳහා මුදල් ඉල්ලා ඇති බවත්, එහිදී තුරු උයන සංවර්ධනය වන බවත් පැවසීය. ඉහත යෝජනා 06:01:04 පිළිබඳ ක්‍රියා කිරීමට නීතිමය තත්වයක් නොමැති බැවින් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ මෙම විෂය සම්බන්ධයෙන් අදාළ නිළධාරිතුමා දැනුවත් කර පසු විපරම් කළ යුතු අතර පොලිස් මුරපොල නැවත ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් අදහස් දක්වමින් පදික කඩ ස්ථාපිත කර ඇති ස්ථානයේ සහකාර පොලිස් අධිකාරිතුමාට ස්ථානයක් වෙන් කර ඇති බැවින් ඉදිරියේදී එහි පොලිස් මුරපොල පිහිටුවන බවද සී.සී. විද්‍යාලය ඉදිරිපිට මාර්ගයේ මේ වන විටත් "No Parking" පුවරුව සවිකර ඇති බවද පැවසීය.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:02 ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මාලීක්ෂා මැතිතුමා**

**06:02:01** බළන්ගොඩ විලියම් මාවත 1 වැනි පටුමග කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම.

**06:02:02** බළන්ගොඩ මුස්තාපා මාවත ප්‍රවේශ මාර්ගයේ ජලය බැසීම සඳහා කාණු ඉදිකර පාර අළුත්වැඩියා කිරීම.

**06:02:03** බළන්ගොඩ කහටපිටිය පාර ගව ඝාතකාගාරයට යාබද බොස්කොම්බේ පාර ඉතිරි කොටස සංවර්ධනය කිරීම.

**06:02:04** දෙහිගස්තලාව ලංකාභරණ පාර (තේ කර්මාන්ත ශාලාව අසල) සිට මහවත්තට යන මාර්ගය දිවංගත සී.එල්.එම්.මරික්කාර් මහතා නමින් නම් කිරීම

**06:02:04** බළන්ගොඩ කුමාර විද්‍යාල සඳහා කලින් පැවති ප්‍රවේශ මාර්ගය (පඩිපෙළ) නැවත ස්ථාපනය කිරීම

**06:02:06** දෙහිගස්තලාව හිටපු අධ්‍යාපන අධ්‍යක්ෂ මහතාගේ නිවස අසළ පාහිර් මහතාගේ මහ ගෙදරට යන මාර්ගයට අවහිරව තිබෙන විදුලි කණුව ඉවත් කර අඩි 03 ක් දුරට ස්ථාපිත කිරිම.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මාලීක්ෂා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වූ **ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මාලීක්ෂා මැතිතුමා** බළන්ගොඩ විලියම් මාවත 1 වැනි පටුමග කොන්ක්‍රීට් කර සංවර්ධනය කර දෙන ලෙසත්, බළන්ගොඩ මුස්තාපා මාවත ප්‍රවේශ මාර්ගයේ ජලය බැසීම සඳහා කාණු ඉදිකර පාර අළුත්වැඩියා කර දෙන ලෙසත්, බළන්ගොඩ කහටපිටිය පාර ගව ඝාතකාගාරයට යාබද බොස්කොම්බේ පාරෙහි කොටසක් සංවර්ධනය කර ඇති අතර ඉතිරි කොටස සංවර්ධනය කර දෙන ලෙසත් පැවසීය.

එමෙන්ම දිවංගත සී.එල්.එම්.මරික්කාර් මහතා සමාජයට ඉතා විශාල සේවයක් සිදු කළ නායකයෙක් බැවින් දෙහිගස්තලාව ලංකාභරණ පාර (තේ කර්මාන්ත ශාලාව අසල) සිට මහවත්තට යන මාර්ගය දිවංගත සී.එල්.එම්.මරික්කාර් මහතා නමින් නම් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස පැවසීය.

බළන්ගොඩ කුමාර විද්‍යාල සඳහා කලින් පැවති ප්‍රවේශ මාර්ගය (පඩිපෙළ) නැවත ස්ථාපනය කිරීම පිළිබඳ අදහස් දක්වමින් කුමාර විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් මෙහි අවශ්‍යතාවය පැහැදිලි කරමින් ලබා දුන් ලිපියක් සභාව වෙත ඉදිරිපත් කරන ලදී. 1990 ගිලන් රථය නවතා තැබීමට අවශ්‍ය ස්ලැබ් එකක් දමා ලෙස සකස් කර ඊට ඉහළින් පඩිපෙළ සැකසිය හැකි බවද විදුහල්පතිතුමා පැවසූ බවත්, සභාපතිතුමා මැදිහත් වුවහොත් මෙය ඉක්මනින් ඉටුකළ හැකි බවත් පැවසීය.

වැඩිදුරටත් අදහස් දක්වමින් දෙහිගස්තලාව හිටපු අධ්‍යාපන අධ්‍යක්ෂ මහතාගේ නිවස අසළ පාහිර් මහතාගේ මහ ගෙදරට යන මාර්ගය පුද්ගලික පාරක් වන අතර

මාර්ගය මැද ඇති විදුලි කණුව හේතුවෙන් ත්‍රීවීල් එකක් හෝ ඇතුල් කිරීමට නොහැකි බැවින් හදිසියේ රෝගියෙකු හෝ රැගෙන යාමට නොහැකි බව පැවසීය. එම නිසා මෙම විදුලි කණුව ඉවත් කර අඩි 03 ක් දුරට ස්ථාපිත කර දෙන ලෙස පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා** අදහස් දක්වමින් බළන්ගොඩ කුමාර විද්‍යාල සඳහා කලින් පැවති ප්‍රවේශ මාර්ගය (පඩිපෙළ) නැවත ස්ථාපනය කිරීමේ යෝජනාව රථ වාහන කමිටුවේදීද ඉදිරිපත් වූ අතර සහකාර පොලිස් අධිකාරිතුමා මොනම හේතුවක් නිසාවත් පොලිස් ස්ථානයට මුහුණලා පඩිපෙළක් දැමීමට ඉඩ දිය නොහැකි බව පැවසූ අතර ඒ සම්බන්ධව විරුද්ධත්වයක් දැක්වූ බව පැවසීය.

මෙහිදී අදහස් දැක්වූ **ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා** පවසා සිටියේ මෙය කෙසේ හෝ ඉටු කළ යුතුවන අතර තමා සමගද කුමාර විද්‍යාලයේ විදුහල්පතිතුමා මේ සම්බන්ධව සාකච්ඡා කළ බවයි. එමෙන්ම මාර්ග තදබදයට විකල්පයක් වශයෙන් මෙන්ම විශේෂයෙන් බස් නැවතුම්පළ කරා යන දරුවන්ට, දෙමාපියන්ට සහ ගුරුවරුන්ට මෙම මාර්ගය මහත් අස්වැසිල්ලක් වන බව වැඩිදුරටත් පැවසීය.

මෙහිදී අදහස් දැක්වූ **ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා** කුමාර විද්‍යාලයේ දරුවන්ට උදෑසන පාසල් යාමට සිදුවී තිබෙන්නේද බන්ධනාගාරය දෙස බලමින් වන අතර එම විද්‍යාලයේ පවතින උත්සවයකට වුවද යාමට සිදු වී ඇත්තේ අඹ ගස යටින් බැවින් එය ඉතා අශෝභනකාරී බව පැවසීය. එම නිසා බළන්ගොඩ කුමාර විද්‍යාල සඳහා කලින් පැවති ප්‍රවේශ මාර්ගය (පඩිපෙළ) අඩි 20ක් පමණ උසක් වන සේ නැවත ස්ථාපනය කිරීම සුදුසු බව පැවසීය.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:03 ගරු නාගරික මන්ත්‍රි රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා**

**06:03:01** මස්සැන්න පාරට හැරෙන හන්දියේ කාණුව කොන්ක්‍රීට් කිරීම.

**06:03:02** මස්සැන්න පාරෙන් රත්ඔවිට පාරට හැරෙන හන්දියෙහි "කුණු දැමීම තහනම්"යනුවෙන් නාම පුවරුවක් ගැසීම.

ගරු නාගරික මන්ත්‍රි රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රි එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රි රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා අදහස් දක්වමින් මස්සැන්න පාරට හැරෙන හන්දියේ කාණුවට උඩින් කොන්ක්‍රීට් ලෑලි දමා සකස් කරදෙන ලෙස ඉල්ලා සිටි අතර ඒ සඳහා අවශ්‍ය වන්නේ කොන්ක්‍රීට් ලෑලි දහයක් පමණක් බවත්,

එවිට එම ස්ථානයේ පවතින ත්‍රීවිල් රථගාල මාර්ගයෙන් පිටුපසට වන්නට ගත හැකිවන බවත් පැවසීය.

වැඩිදුරටත් අදහස් දක්වමින් මස්සැන්න පාරෙන් රත්ඹිවිට පාරට හැරෙන හන්දියෙහි මිනිසුන් කුණු කසළ දමන බැවින් "කුණු දැමීම තහනම්" යනුවෙන් නාම පුවරුවක් ගැසීම හෝ ජංගම සීසීටීවී සවිකරන ලෙස ඉල්ලා සිටියේය.

මෙහිදී පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමා පවසා සිටියේ යෝජනා අංක **06:03:01** පිළිබඳව විධායක ඉංජිනේරුතුමා දැනුවත් කරන බවයි.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:04 ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

**06:04:01** ගඟට සමාන්තරව ඇති පරණ මාර්ගය අළුතින් ඉදිකල රථ අංගනයට අයිනෙන් ලංකා බැංකු මාවත දක්වා ඇවිදින මංතීරුවක් ලෙස දැනට සෑදීමෙන් අනතුරුව මාර්ගයක් ලෙස පුළුල් කර සංවර්ධනය කිරීම.

**06:04:02** කුමාර විද්‍යාලය සිට ප්‍රධාන තැපැල් කාර්යාලය දක්වා ඇති මාර්ගයේ (පල්ලිය පාර) හයර් සඳහා වෑන් ඇති ස්ථානයේ කාණුව ඉතා ගැඹුර බැවින් ඒ මතට කොන්ක්‍රීට් ස්ලැබ් ආවරණය කර දීම

**06:04:03** ගිනි නිවන රථයට තිසි තැනක් ස්ථාපනය කර දීම සහ එය මසකට වරක් හෝ පණ ගන්වා එම රථය අඩුපාඩු නැතිව ඕනෑම අවස්ථාවකට මුහුණ දීමට අවශ්‍ය බට ආදිය සූදානම් කර තැබීම.

**06:04:04** ජල සම්පත් මණ්ඩලය සමඟ සාකච්ඡා කොට නගරයේ ස්ථාන කිහිපයක් ජලය ගැනීමට හැකි අයුරින් ලොකු බට සූදානම් කර කරාම සවි කිරීම.

(මෙය වරින් වර වෙළෙඳ සංගමය විසින් ජල සම්පත් මණ්ඩලය දැනුවත් කර ඇත)

**06:04:05** ලබන වසරේ වෙලෙඳ ව්‍යාපාරිකයන්ගේ වෙළෙඳ බලපත්‍රය ලබා දෙන විට වෙළෙඳ සංගමය සමග එක්ව වෙළෙඳුන් දැනුවත් කර සවි කිරීමට ශක්තිය ඇති සෑම වෙළෙඳ සැලකටම ගිනි නිවන උපකරණයක් සවිකිරීමට උපදෙස් දීම සහ එය බල කිරීම.

**06:04:06** නගරයේ ගල්වල ළඟ සහ බෝම්බුව පාර ආසන්නයේ බස් නැවතුම පෙනෙන ආකාරය මාර්ගයේ ⊗ ලකුණ සටහන් කිරීම සහ බෝම්බුව පාර ආසන්නයේ බස් නැවතීමට අවහිර වන සේ ඇති වාහන ඉවත් කර දෙන ලෙස නාම පුවරුවක් ස්ථාපනය කිරීම.

**06:04:07** ලංකා බැංකුව අසලින් දිවෙන මාර්ගය" ලංකා බැංකු මාවත" නමින් නම් කිරීම.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගඟට සමාන්තරව ඇති පරණ මාර්ගය අළුතින් ඉදිකල රථ අංගනයට අයිනෙන් ලංකා බැංකු මාවත දක්වා ඇවිදින මංතීරුවක් ලෙස දනට සෑදීමෙන් අනතුරුව මාර්ගයක් ලෙස පුළුල් කර සංවර්ධනය කර දෙන ලෙස ඉල්ලා සිටි අතර මෙම අවස්ථාවේදී මෙම කර්මාන්තය ඉටු කිරීම සඳහා වියදමක් දැරීමට නොහැකි නම් සභාවේ බැකෝ යන්ත්‍රය යොදා ගනිමින් මාර්ගය ශුද්ධ කර, මිනිස්සුන්ට මාර්ගයේ පයින් යාමට හැකිවන සේ ලංකා බැංකුව අසල මාර්ගය තෙක් කොන්ක්‍රීට් කර සකස් කර දෙන ලෙස පවසා සිටියේය.

එමෙන්ම කුමාර විද්‍යාලය සිට ප්‍රධාන තැපැල් කාර්යාලය දක්වා ඇති මාර්ගයේ (පල්ලිය පාර) සමනළ වෑන්රථ ගාල පවතින ස්ථානයේ කෙටි දුරක් පමණක් කොන්ක්‍රීට් පියන් දමා සකස් කර ඇති අතර එම ස්ථානයේ කාණුව ඉතා ගැඹුර බැවින් ඉතා විශාල අවධානමක් පවතින බව පැවසීය. ළමයින්ට සිදු වී ඇත්තේ පාර්ක් එකේ වෑන් රථ හා පාරේ යන වාහන අතරින් ගමන් කිරීමට බැවින් ඒ මතට කොන්ක්‍රීට් ස්ලැබ් දමා ආවරණය කර දෙන ලෙස ඉල්ලා සිටියේය.

වැඩිදුරටත් අදහස් දක්වමින් ගිනි නිවන රථයට නිසි තැනක් ස්ථාපනය කරන ලෙසත් එය මසකට වරක් හෝ පණ ගන්වා අඩුපාඩු නැතිව ඕනෑම අවස්ථාවකට මුහුණ දීමට හැකි පරිදි සකස් කර තැබීම සුදුසු බවත් පැවසීය. එමෙන්ම අවශ්‍ය අවස්ථාවන්හි ගිනි නිවන රථය සඳහා ජලය ලබා ගැනීමට ජල සම්පත් මණ්ඩලය සමඟ සාකච්ඡා කොට නගරයේ ස්ථාන කිහිපයක ලොකු බට සූදානම් කර කරාම සවි කිරිමට අවශ්‍ය කටයුතු කරන ලෙස පැවසීය. තමන් කිහිප අවස්ථාවක මේ පිළිබඳව ජල සම්පත් මණ්ඩලය සමඟ සාකච්ඡා කළ අතර එවිට නගර සභාව මඟින් අවශ්‍ය ස්ථාන පෙන්විය යුතු බව පැවසූ බවත්, අඩියක් පමණ උසට බටයක් දැමීම ප්‍රමාණවත් බවත් පැවසීය.

ලබන වසරේ වෙළඳ ව්‍යාපාරිකයන්ගේ වෙළෙඳ බලපත්‍රය ලබා දෙන විට වෙළෙඳ සංගමය සමඟ එක්ව වෙළෙඳුන් දැනුවත් කර සවි කිරීමට ශක්තිය ඇති සෑම වෙළෙඳ සැලකටම ගිනි නිවන උපකරණයක් සවිකිරීමට උපදෙස් ලබා දී එය බල කරන ලෙසත් මේ සඳහා කඩ හිමියන් සඳහා වැඩි වියදමක් දැරීමට සිදු නොවන බවත් පැවසීය.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

මෙහිදී 2019.05.31 දින හා 2019.06.13 දින පැවති මුදල් කමිටු වාර්තා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන්ගේ ස්ථිරත්වයෙන් සභාවේ ඒකමතිකව සම්මත විය.

08. **ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 21,355,231.47 |
| වෙනත් ලැබීම් | 1,666,122.57 |
| මුලු ලැබීම් | 23,021,354.04 |
| පුනරාවර්තන වියදම් | 9,985,273.25 |
| වෙනත් වියදම් | 13,991,653.25 |
| මුලු වියදම් | 23,976,926.50 |

**ඉන්ධන වාර්තාව ඉදිරිපත් කිරීම.**

2019-06-01 සිට 2019-06-31 දක්වා

| **වාහන අංකය** | **මුළු එකතුව** |
|---|---:|
| 226-7521 | 18,696.00 |
| 227-5020 | 29,658.00 |
| 56-1906 | 12,272.00 |
| BC-0005 | 31,995.00 |
| DDR-0008 | 1,040.00 |
| RD-8000 | 1,040.00 |
| GC 0001 | 9,780.00 |
| | 405.00 |
| GK-1483 | 9,360.00 |
| GK-6227 | 27,076.00 |
| | 795.00 |
| JD-4684 | 1,104.00 |
| LL-2110 | 14,156.00 |
| ND-5124 | 31,616.00 |
| OS-0006 | 1,380.00 |
| ov/m 0017 | 690.00 |
| PF-4006 | 20,304.00 |
| QL-2901 | 5,520.00 |
| RB-4786 | 30,716.00 |
| RC-1107 | 21,876.00 |
| RC-1118 | 31,236.00 |
| RC-8183 | 31,738.00 |
| RD-8240 | 22,396.00 |
| RE-2600 | 26,000.00 |

| | |
|---|---|
| UQ - 1933 | 4,140.00 |
| vi-1833 | 1,380.00 |
| ZA - 9835 | 19,032.00 |
| YG-0758 | 2,070.00 |
| ZA - 5039 | 61,812.00 |
| **එකතුව** | **469,283.00** |

**මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**09. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්.**

**ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් අද දින ත්‍රීවිල් සම්බන්ධයෙන් ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා මැතිතුමිය කාලෝචිත යෝජනාවක් ගෙන ආ බව පවසා ඒ පිළිබඳව අදහස් දක්වමින් මීට වසර 8-9 කට පෙර විද්‍යාලෝක විද්‍යාලය ඉදිරිපිට වාහන සුළු ප්‍රමාණයක් පමණ තිබූ අතර කාලයාගේ ඇවෑමෙන් මේ වන විට වාහන විශාල ප්‍රමාණයක් නවතා තිබෙන බව පැවසීය. අද වන විට පෙට්ටිගලට හැරෙන හන්දියේ පවතින ත්‍රීවිල් පාර්ක් එකේ තිබෙන ඇතැම් ත්‍රීවිල් කුඩු ගංජා විකුණන බව තමා වගකීමෙන් පවසන අතර බෝම්බුව බල ප්‍රදේශය තුළ ඉතා ප්‍රබල ලෙස කුඩු හා ගංජා වසංගතය පැතිරෙන බව පැවසීය.

කුඩු වසංගතය නිසා රටේ අනාගත පරම්පරාව පිරිහෙමින් පවතින කාලවකවානුවක බලන්ගොඩ නගරය තුළ ද කුඩු වසගංතය ඉතා ඉක්මනින් පැතිර යන අතර ඒ සඳහා පියවරක් ගැනීම සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයේ සියලු දෙනාගේ වගකීමක් බව පැවසීය. එමෙන්ම සමහර ත්‍රීවිල් පාර්ක් වල තිබෙන ත්‍රීවිල් කිහිපයක් කරන වැරදි නිසා ත්‍රීවිල් යන බහු වචනය යෙදීම වැරදි බව පැවසීය. එම නිසා මේ පිලිබඳ විශේෂ අවධානය යොමු කර දැන්විය යුතු අදාළ ස්ථාන වලට දන්වා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස පැවසීය.

වැඩිදුරටත් අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා පවසා සිටියේ ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මාලික්ෂා මැතිතුමා රැගෙන ආ කුමාර විද්‍යාලය සඳහා පොලිස් ස්ථානය අසළ පැරණි පිවිසුම (පඩිපෙළ) සෑදීම සම්බන්ධයෙන්ද අවධානය යොමු කරන ලෙසයි.

**ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ ජෙයිලානි විද්‍යාලයට යාබද ගොඩ කුඹුර නැමති ඉඩමෙහි මදාහිමා නැමති අයෙකුගේ ප්ලෑන් එකක් අනුමත කර ගැනීමට නොහැකි වී ඇති බවයි. එමෙන්ම එම ඉඩම කොටස් තුනකට බෙදා අංක 27,28,හා 29 යනුවෙන් වරිපනම් අංක ලබා දී ඇති අතර මේ වන විට අංක 27, හා 29 යන ඉඩම් දෙක සඳහාම අවශ්‍ය ගොඩනැගිලි අයදුම්පත් අනුමත කර දී ඇති අතර නමුත් අංක 28 ඉඩම හිමි මදාහිමා නැමති අයගේ ගොඩනැගිලි අයදුම්පත මේ වන විටත් අනුමත කර දී නොමැති බව පැවසීය.

තමාට හැගෙන පරිදි මෙම ඉඩම සම්බන්ධව ගැටළුවක් නොමැති අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිදි එකම කාරණයක් සම්බන්ධයෙන් පුද්ගලයින් දෙදෙනෙකුට දෙවිදිහකට සැලකිය නොහැකි බවත්, සාධාරණ නම් පමණක් මදාහිමා නැමති අයගේ ගොඩනැගිලි අයදුම්පත අනුමත කර දීම සඳහා අවශ්‍ය කටයුතු කරන ලෙසත් පැවසීය. එමෙන්ම මෙම ඉඩම පර්චස් 12 ක ඉඩමක් වන අතර මෙය කුඹුරක් බව පවසන නමුත් පර්චස් 12ක කුඹුරු තිබෙන්නේ කොහේදැයි විමසා සිටියේය. මොවුන් ඉතා අසරණ පවුලක් වන අතර එක නිවසක පවුල් හතරක් හො පහක් එකට ජීවත් වෙන බැවින් අනිත් අයට ගත් ක්‍රමවේදය ක්‍රියාත්මක කරන ලෙස වැඩිදුරටත් අදහස් දක්වමින් පවසා සිටියේය.

මෙහිදී පිළිතුරු ලබා දුන් **ගරු සභාපතිතුමා** මෙම ගොඩනැගිලි අයදුම්පත සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් ගොවිජන සේවා කොමසාරිස් ජනරාල් වෙත යාම සඳහා උපදෙස් ලබා දුන්නද, තමා පැවසුවේ අනිත් අය සඳහා ගත් ක්‍රමවේදයම මෙම ගෙන කඩිනමින් ක්‍රියා කරන ලෙසයි.

**ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා**

තමා අද දින සභාවට පැමිණීමට ප්‍රමාද වූයේ පාසල් සංවර්ධන සමිතියට සහභාගි වූ නිසා බවත්, තමා සභාවේ නොමැති අවස්ථාවේ දී ගිය වර සභාවේ තමා කළ ප්‍රකාශය සංශෝධනය කිරීම පිළිබඳ තමා තරයේ විරුද්ධ වන බව පවසා සිටි ගරු උප සභාපතිතුමා සභා වාර්තාව යනු හැමදෙනාම පවසන සියලු දේ වාර්තා කරන ලියවිල්ලක් නොවන බව පැවසීය. එබැවින් මෙය සභා වාර්තාවේ සංශෝධනය නොකරන ලෙස ඉල්ලා සිටියේය.

එමෙන්ම ජෙයිලානි විද්‍යාලය සඳහා තට්ටු හතරක නව ගොඩනැගිල්ලක් වර්තමාන රජය මගින් ඉදිකර ඇති අතර එම ගොඩනැගිල්ල ද ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා පැවසූ ඉඩමටම අයිති කොටසක ඉදිකර ඇති බවත්, වරිපනම්

අංක 27,28, හා 29යන ඉඩම් තුනම පර්චස් 115 සහිත එකම ප්ලෑනක් යටතේ පිහිටා ඇති බවත් පැවසීය. එමෙන්ම නෝම්බි කාලයට පල්ලි මඟින් ලබා දෙන සල්ලි

යොදවා මුස්ලිම් ජනතාව නිවාස ඉදිකරන බැවින් අනවසර ඉදිකිරීම් සිදු වන බවත්, එසේ අනවසර ඉදිකිරීම් සිදුවීමට හේතුව ඔවුන්ගේ දූප්පත් කම බවත් පැවසීය. සභාපතිතුමාගේ බලතල පරිදි නිවසක් සෑදීම සදහා පර්චස් හයක් අවශ්‍ය නොවන අතර ගොඩනැගිලි අයදුම්පත් අනුමත කිරීමේදී පැන නැගෙන ප්‍රධානම ගැටලුව ඉඩමේ මුල් ඔප්පුව නොමැති වීම බව පැවසූ ගරු උප සභාපතිතුමා අනවසර ඉදිකිරීමට ප්‍රධාන හේතුව ද මෙය බව පැවසීය. එක් නිවසක පවුල් හතරක් හෝ පහක් ජීවත් වන අතර බලන්ගොඩ ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා කටයුතු කරන ලෙස පැවසීය.

වැඩිදුරටත් අදහස් දක්වමින් අදවන විට උෟරු මස් කඩ කාමරය සම්මත වීම පිළිබඳ මුස්ලිම් සමාජය වෙත වැරදි මතයක් ගොස් ඇති බව පැවසිය.

දේශපාලනයේ සදාකාලික හතුරන් මෙන්ම මිතුරන්ද නොමැති බවත්, තමා ජාතිවාදය කිසිදිනෙක නොකරන අතර ඊර්ෂ්‍යාව කුහකකම නොමැතිව ජීවත්විය යුතු බව පවසමින් ගරු උප සභාපතිතුමාගේ අදහස් දැක්වීම අවසන් කළේය.

මෙහිදී පිළිතුරු ලබා දුන් **ගරු සභාපතිතුමා** ගොඩනැගිලි අයදුම්පතක් අනුමත කරන්නේ විවිධ ආයතන ගණනාවකින් එකතු වූ කමිටුවක් මඟින් වන අතර පර්චස් 40ට වඩා වැඩි ඉඩම් සඳහා වන ගොඩනැගිලි අයදුම්පත් අනුමත කිරීම තමාට කළ නොහැකි බවත්, එය නාගරික සංවර්ධන අධිකාරිය අනුමත කරන බවත් පැවසීය. එමෙන්ම තමා දේශපාලන පක්ෂ, ජාති භේද නොසළකා කටයුතු කරන අතර අදාළ කමිටුව මඟින් ඉටු කළ නොහැකි දෙයක් තිබේනම් තමා ඒ පිලිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් අදාළ නිළධාරින් සමඟ ගැටුම් ඇති කර නොගනිමින් කමිටු තීරණ නොසළකා අවශ්‍ය අවස්ථාවන්හි කටයුතු කරන බව පැවසීය.

**<u>ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා තමා ද දැන් පොහොට්ටුවේ සාමාජිකයෙකු බව පවසමින් තම අදහස් දැක්වීම ආරම්භ කළ අතර මෙවර සභාව පත්වී වසර එක හමාරක් පමණ ගත වුවද මේ වන තෙක් එක් වරක් හෝ යහසාධක සංගමයේ රැස්වීමක් නොපැවැත් වූ බැවින් එය කැඳවන ලෙස පැවසීය.

එමෙන්ම මෙම සභාව පත්වී වසර එක හමාරක් ගත වී ඇතත් මෙතෙක් දුන් යෝජනා කිසිවක් ඉටු වී නොමැති අතර තමා සභාව වෙත ලබා දුන් පළමු යෝජනාව වන දේශබන්දු මහතාගේ නිවසට මාර්ගය සංවර්ධනය කිරීම ගිය මාසයේ ආරම්භ කරන බව පැවසුවද මේ වන තෙක් එය ඉටු වී නොමැති බව පැවසීය.

එමෙන්ම මාර්ග සංවර්ධන අධිකාරිය සමග එකතු ඕලුගංතොට වේග සීමා ලකුණු කිරීම හා ඇල්ෆාවත්ත තේ කර්මාන්ත ශාලාව අසළින් යන මාර්ගය අලුත්වැඩියා කර දෙන ලෙස ඉල්ලා සිටියද මේ වන තෙක් ඉටු වී නොමැති බව පැවසීය.

ගරු උප සභාපති එම්.ටී.එම්. රුමී මැතිතුමා තමා සමග කාලයක් සිටි අතර මෙම ආණ්ඩුව හෙට වට්ටන්න පුලුවන්නම් හෙට වට්ටන අතර ඌරු මස් කඩයක් අවශ්‍ය නොවන නමුත් ඌරු මස් කඩය පිළිබඳ යෝජනාව එක්සත් ජාතික පක්ෂයෙන් ගෙන ආ නිසා එය දිනවීමට ඡන්දය ලබා දුන් බවත්, ඌරු මස් කඩය දැමීම හා ධීවර සංස්ථාව දැමීම සඳහා බල කරන බවත් පවසමින් අදහස් දැක්වීම අවසන් කළේය.

## ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා

අදවන විට ඕලුගංතොට ප්‍රදේශයේ ගංගාරාම පන්සල ඉදිරිපිට වලවේ ගඟට වීදුරු කටු ආදී කසළ විශාල වශයෙන් දමන බවත් වාහන වලින් ගමන් කරන අතරතුර ගඟට කසළ දමන බවත්, ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙසත් ඉල්ලා සිටියේය.

## ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා

තමා විසින් මෙවර මහ සභාව සඳහා "ඩෙංගු ව්‍යාපෘතිය සම්බන්ධයෙන් බලගහමුල ප්‍රදේශයේ ව්‍යාපෘතියක් දක්නට ඇති අතර මෙම තත්වය පාලනය කර ගැනීම සඳහා නගර සභාව බළන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලයද සම්බන්ධ කර ගනිමින් කඩිනමින් යම් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම යෝග්‍ය යැයි" පවසා එවන ලද යෝජනාව තමන් ඉදිරිපත් කලේ වෛද්‍ය නූර්දීන් රිෆයිඩින් මහතා ඩෙංගු ව්‍යාප්තිය හා එහි බලපෑම ගැන දැනුවත් කිරීම සඳහා අවස්ථාවක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කළ නිසා බවත්, සභාපතිතුමන් විසින් රැකියා ලබාදුන් අවස්ථාවේ තමන් ඇතුළු තම කණ්ඩායම එයට විරෝධය නොදැක්වූ බවත්, එසේ විරුද්ධ වූවානම් අදටත් එම අවස්ථා ලබා දීමට හැකියාවක් නොලැබෙන බවත් පැවසීය. එබැවින් සභාවට යෝජනාවක් ලබා දුන් විට අභිමානයක් ගරුත්වයක් ලැබෙන පරිදි කටයුතු කරන ලෙස ඉල්ලා සිටියේය.

එමෙන්ම බළන්ගොඩ ප්‍රදේශයේ කුඩු ව්‍යාප්තිය පවතින බවත්, ඕලුගංතොට ප්‍රදේශයේ පදික කඩ ඉවත් කිරීම සාධාරණ නමුත්, සමහර කඩ හිමියන් තම පවුල නඩත්තු කරන්නේද දරුවන් පාසල් යවනුයේද එම කඩයෙන් ලැබෙන ආදායමෙන් බවත්, එම කඩ හිමියන් විසි දෙනා සඳහා කිරිහල ආසන්නයේ කඩ කාමර තනා දීම සුදුසු බවත් පැවසීය.

වැඩිදුරටත් අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා වලවේ ගඟට කුණු කසළ දැමීමට සම්පූර්ණයෙන්ම විරුද්ධ බවත්, ඒ සම්බන්ධයෙන් පියවරක් ගන්නා ලෙසත් පැවසීය.

එමෙන්ම වැසි දිනවලදී නගරයේ ඇතැම් පිරිස් නිවෙස්වල වැසිකිළි වලවල් දොරවෙල ගඟට හරවන බැවින් ඒ සම්බන්ධව සොයා බලා කටයුතු කරන ලෙස පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මාලීක්ෂා මැතිතුමා**

ඌරු මස් සඳහා කඩ කාමරයක් දැමීම සඳහා සභාවේ සම්මත වීම පිළිබඳ සිංහල මාධ්‍ය තුළ වාර්තා කළ ද දෙමළ මාධ්‍ය තුළ කිසි දෙයක් වාර්තා නොවූ බැවින් මේ පිළිබඳව කිසිම තොරතුරක් මුස්ලිම් ජනතාව වෙත නොගොස් ඇති බවත්, ඒ පිළිබඳව තමා කණගාටු වන බවත් පවසා සිටියේය.

එමෙන්ම නවක මන්ත්‍රීවරු හඳුනා ගැනීම සඳහා වර්තමාන මන්ත්‍රීවරුන්ගේ ජායාරූප ප්‍රදර්ශනය කරන ලෙස පැවසීය.

තමා කිසිදිනෙක වෛරී දේශපාලනයක් සිදු නොකරන බවත්, කිසි දිනෙක පළිගැනීම් ආදිය සිදු නොකළ අතර තමා අවු 38ක් පාසල් ගුරුවරයෙකු වශයෙන් සේවය කළ බවත්, කිසි කෙනෙකු පිළිබඳ වැරදි දෙයක් සමාජයට ගෙන ගොස් නොමැති අතර තමා මෙවර සභාවට තේරී පත්වුවද ලබන වර මැතිවරණයේදී තමා අපේක්ෂකයෙකු වශයෙන් ඉදිරිපත් විම හො නොවීම සිදුවිය හැකි බවත්, එබැවින් කිසිකෙනෙකුට විරුද්ධව වචනයක්වත් නොකියන බවත් පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය**

තමා පෙර සභාවේ ඉදිරිපත් කළ යෝජනා අතරින් එක් යෝජනාවක් පමණක් ඉස්මතු කරමින් මාධ්‍ය වාර්තා කළ අතර එසේ වීමෙන් තමන් බොහෝ දෙනාගේ දෝෂාරෝපණයට ලක් වූ බව පැවසීය.

එමෙන්ම කරවිකැටිය මාර්ගයේ අතුරු මාර්ගවල නාම පුවරු ගැසීම පිළිබඳ එම ප්‍රදේශයේ ජනතාව තමන්ගෙන් විමසා සිටි බව පවසමින් එම කාර්ය සභාවෙන් කිරීමට අපහසු නම් එම ප්‍රදේශවාසීන් විසින් එය සිදු කිරීම සඳහා සභාවෙන් අවසර ලබා දෙන ලෙස ඉල්ලා සිටි බවත්, එබැවින් එම කාර්යය ඉටු කර දෙන ලෙසත් පැවසීය.

කරවිකැටිය කාණු පද්ධතියට බේකරියක් මඟින් අප ජලය දැමීම සම්බන්ධයෙන් ලොකු ගැටලුවක් පැන නැගුණු අතර මේ සම්බන්ධයෙන් අද දින සභාවේදී සාකච්ඡා කර ගම්වාසීන්ට පිළිතුරු ලබාදිය යුතු පැවසීය. ඒ පිළිබඳව වැඩිදුරටත් අදහස් දක්වමින් ගමේ සියලු දෙනා එක් වී මේ පිළිබඳව මාධ්‍යයවේදීන් පවා දැනුවත් කිරීමට සූදානම් වූ අතර ප්‍රදේශවාසීන් කිහිපදෙනෙකු සමඟ අදාළ ස්ථානය වෙත ගිය අවස්ථාවේදී විශාල

වතුර ප්‍රමාණයක් කාණුවට එන අයුරු දුටු බව පැවසීය. එමෙන්ම අදාළ බේකරි හිමියන් එම ජලය පිරිසිදු කර එවන බව මෙන්ම මෙම කාරණාව සම්බන්ධයෙන් විවිධ ක්‍රියාමාර්ග ගනු ලබන බව පැවසුවද කාණුවට අසූචි ජලය පැමිණෙන බව පැවසීය.

වැඩිදුරටත් අදහස් දක්වමින් එම කාණුව 100M පමණ කොටසක් සංවර්ධනය කර නොමැති අතර එම ස්ථානයේ වතුර පල් වී ඇති බවත්, අසල නිවසක දරුවෙකුට ඩෙංගු රෝගය වැළදීම, මැස්සන් බෝ වී තිබීම ආදී අහිතකර ප්‍රතිඵල දක්නට ඇති බවත් පැවසීය. මහජන සෞඛ්‍ය පරීක්ෂක තුමා විවිධ අවස්ථා වලදී ගොස් බේකරි හිමියක් දැනුවත් කළද යහපත් ප්‍රතිඵල නොලැබෙන බව පැවසීය. මෙම අයහපත් ප්‍රතිඵල තිබේ යැයි කියා බේකරිය වැසීම සඳහා යෝජනා කළහොත් එම බේකරියේ සේවය කරන විසි දෙනෙකුගේ රැකියා අහිමි වී යන බැවින් එසේ නොකර මේ පිළිබඳව අවධානය යොමු කර වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස පැවසීය.

**<u>ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා</u>**

ගිය වර සභාවේ සම්මත වූ ඌරු මස් විකිණීම සඳහා කඩ කාමරයක් ලබා දීම යෝජනාව පිළිබඳ අදහස් දක්වමින් තමන් මෙම අවස්ථාවේදී ඌරු මස් කඩයක් දැමීම සුදුසු නොමැති බව සඳහන් කරමින් තමන් ඒ සම්බන්ධව විරුද්ධ වු බවත්, පොසොන් පොහොය යෙදී තිබෙන මාසයේ මෙම යෝජනාව රැගෙන ඒම නිසා මෙය තවත් උඩු දුවන බවත් පැවසීය.

**<u>ගරු නාගරික මන්ත්‍රී කේ.පී.පේමදාස මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රී කේ.පී.පේමදාස මැතිතුමා අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා වීරසිංහ මැතිතුමිය මාධ්‍ය මඟින් වාර්තා පළ කරන අවස්ථාවලදී අදාළ ප්‍රවෘත්ති සියල්ල පළනොකරන බව පවසමින් චෝදනාවක් එල්ල කළද, අදාළ ප්‍රවෘත්තිය මාධ්‍ය ආයතනය මඟින් සංස්කරණය කර පළ කරන බව පැවසීය.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වාර්තාවක් අනුව සබරගමුව පළාත තුළ වැඩිපුරම කුඩු විකිණෙන නගරය බළන්ගොඩ වන අතර දෙවැනි තැන කළවාන හා අඩුවෙන්ම විකිණෙන නගරය ඇඹිලිපිටිය බව පැවසීය. මුළු රටේම පවුල් ඒකක 5,264,282 තිබෙන අතර සෑම පවුල් 50 කටම කුඩුකාරයෙක් හා හිර කාරයෙක් සිටින බව, දිනකට දාහතර දෙනෙක් සියදිවි හානි කර ගන්නා බව, පැය හතරකට වර්ක් ස්ත්‍රී දූෂණයක් සිදු වන බව හා දිනකට රිය අනතුරු අටක් සිදු වෙන බව පැවසීය. එමෙන්ම ශ්‍රී ලංකාව දූෂණ රටවල් අතරින් හතරවන ස්ථානයේ පසුවන අතර මත්ද්‍රව්‍ය පිටුපස ප්‍රබල දේශපාලඥයො සිටින බව පැවසීය. අදවන විට ශ්‍රී ලංකාව කුඩු අපනයනය කරන මධ්‍යස්ථානයක් හා දකුණු ආසියාවේ වැඩිපුරම කුඩු පරිහරණය කරන රට බවට පත්වී ඇති බව පැවසීය. වැඩිදුරටත් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රීතුමා අවුරුදු 71 ක් තිස්සේ රට ආපස්සට ගොස් ඇති බවත්, අද වන විට රට නරක අතට ගොස් පවතින බවත් පැවසීය.

**<u>ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා</u>**

"අන්තෝ ජටා බහි ජටා" යනුවෙන් පවසමින් තම අදහස් දැක්වීම ආරම්භ කළ ගරු නාගරික මන්ත්‍රීතුමා දේශපාලනය යනු පොදු හා පෞද්ගලික ප්‍රශ්න කතා කරන තැනක් බවත්, ඒ සඳහා සභිකයන් වෙත ලැබෙන්නේ මාසයකට එක් දිනක් වන අතර, වෙනත් ස්ථාන වල කතා නොකර මෙම ස්ථානයේම කතා කර අවසන් කිරීම සුදුසු බවත් පැවසීය.

එමෙන්ම කියවීම් ශාලාව අසළ පොලිසියේ වැසිකිළි වල ගඳ එන බැවින් කියවීම් ශාලාවට පැමිණෙන අය මේ නිසා ඉතා අපහසුතාවයකට පත්වන බව පැවසීය.

මහජන පොලේ ගැමුණු සුභ සාධක සංගමය විසින්, ඉරිදා හැර වෙනත් දින වල පොළ පැවැත්වෙන අවස්ථාවලදී දැන්වීම හා බැනර් ප්‍රදර්ශනය කිරීම මඟින් පමණක් මහජනතාව දැනුවත් කිරීම ප්‍රමාණවත් නොවන අතර ශබ්ද විකාශන යන්ත්‍ර මඟින් ජනතාව දැනුවත් කරන ලෙසත්, පොළ වෙනස්වන සතියට පෙර සතියේ මහජනතාව දැනුවත් කරන ලෙසත් ඉල්ලා සිටි බව පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමා වෙළෙන්ඳන් දැනුවත් වීම ප්‍රමාණවත් නොවන අතර පාරිභෝගිකයන් ද දැනුවත් විය යුතු බව පවසා සිටියේය.

නගර සභා ක්‍රීඩාංගණයේ ඉංගිරියේ ගාමන්ට් එකක් කන්ටේනර් මඟින් රෙදි ගෙනවිත් වේලන අතර මෙහි කෙමිකල් එක්ක තිබෙන බැවින් පසුදින වන විට තණකොළ මැලවී තිබෙන බව පැවසීය. මේ වන විට ක්‍රීඩාංගණයේ කිසි විනයක් නොමැති අතර ක්‍රීඩා තරඟාවලියක් පවතින අවස්ථාවලදීද සමහරු ක්‍රීඩාගාරයේ පඩිපෙළෙහි හිඳ බියර් පානය කරන බවත් එය ඉතා අශෝබන දර්ශනයක් බවත් පැවසූ ගරු මන්ත්‍රීතුමා මෙයට හේතුව මුරකරුවෙකු නොසිටීම බව පැවසීය.

වැඩිදුරටත් අදහස් දක්වමින් ක්‍රීඩාංගණයට පුටු 25 ලැබීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වන බවත්, ක්‍රීඩාංගණයේ ජල කරාමය ඇතුලෙන් වසා පැමිණෙන නිසා හවස ක්‍රීඩා කිරීමට පැමිණෙන ළමයින් සඳහා ජලය නොමැති වන අතර ඔවුන් සඳහා අවශ්‍ය ජලය ලබා දීම, එමෙන්ම ක්‍රීඩාංගණය සඳහා සවිකර ඇති ප්ලැසර් සෙනසුරාදා හා ඉරිදා දිනවල හවස 6.30 ත් 7.30 ත් අතර විදුලිය ලබා දීම පිළිබඳ අවධානය යොමු කරන ලෙසත් පැවසීය.

මොහාන් සාලිය එල්ලාවල මාවතෙහි බුද්ධ ජයන්ති විද්‍යාලයට යන මාවත කොන්ක්‍රීට් කිරීමට දානපතියෙකු රු.1,000,000.00 ක මුදලක් ලබා දීමට කැමැත්තෙන් සිටින බවත්, මහජනතාව වෙනුවෙන් සභාපතිතුමාගේ බලය පාවිච්චි කරන්නේ නම් අන් සියලු දෙනා සභාපතිතුමා සමඟ සිටින බවත් පැවසීය.

කුඩු ප්‍රශ්නය ගැන පවසා සිටි ගරු මන්ත්‍රීතුමා 1984 ක්ෂණික දුරකථන අංකයට දැනුම් දීම මඟින් අදාල පාර්ශව දැනුවත් කළ හැකි බව පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් පුබුදමු ගම්මැද්ද වැඩසටහන යටතේ බුලත්ගම කොට්ඨාශයේ වැඩ ආරම්භ කර මාසයක පමණ කාලයක් ගතවී ඇතත් මේ වන තෙක් එම කොට්ඨාශයේ දින හතරක පමණක් වැඩ කර ඇති අතර වැවවත්ත උද්‍යාන මාර්ගයේ බෝක්කුවක් කඩා දමා ඇති නමුත් මේ වන විට එය සාදා නොමැති බැවින් ඒ පිලිබඳව අවධානය යොමු කරන ලෙස සභාපතිතුමාගෙන් ඉල්ලා සිටියේය.

බළන්ගොඩ ප්‍රාදේශීය සභාවට ගරු ආණ්ඩුකාරතුමා පැමිණි අවස්ථාවේ ප්‍රාදේශිය සභාවේ ගරු සභාපතිතුමා තමන් ඇතුලු මන්ත්‍රී මණ්ඩලය ගරු ආණ්ඩුකාරතුමාට හඳුන්වා දුන් අවස්ථාවේදී නගර සභාවට පැමිණි මොහොතේ සභාවට නොපැමිණියේ ඇයිදැයි විමසා සිටි බව පැවසීය. වීදි නාමකරණය යටතේ තමා මෙන්ම මාලීක්ෂා මන්ත්‍රීතුමා හා කේ.ජී.පේමදාස මන්ත්‍රීතුමා මාර්ග තුනක නම් ඉදිරිපත් කළ අතර මේ වන විට එහි ප්‍රගතිය කෙසේදැයි විමසා සිටියේය. බළන්ගොඩ මූලික රෝහල සඳහා අත්‍යවශ්‍යව තිබූ රථගාල සාදා නිම කර ඇති අතර ඒ සඳහා දායක වූ රෝහල් කමිටුමේ සභාපතිතුමා ඇතුලු පිරිසට ස්තුතිය පුද කිරීම සඳහා මෙය අවස්ථාවක් කර ගන්නා බව වැඩිදුරටත් පැවසීය.

එමෙන්ම පේමදාස මන්ත්‍රීතුමා අවුරුදු 71 තිස්සේ රට ආපස්සට ගිය බව පැවසූ අතර එම පාප කර්මය සඳහා ජනතා විමුක්ති පෙරමුණටද අත සෝදා ගත නොහැකි බවත්, ඒ සඳහා ඔවුන්ද වගකිව යුතු අතර එම කාලය තුළ ජනතා විමුක්ති පෙරමුණද කැරළි දෙකක් සිදු කළ බව පැවසීය. එමෙන්ම ජනතා විමුක්ති පෙරමුණ ආණ්ඩු නොකෙරුවද චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිණියගේ කාලයේදී මෙන්ම පවතින ආණ්ඩුව සඳහා ජනතා විමුක්ති පෙරමුණ සහයෝගය ලබා දෙන බව පැවසීය.

මෙහිදි පිළිතුරු ලබාදුන් සභාපතිතුමා පවසා සිටියේ ආණ්ඩුකාරකාරතුමා මෙම සභාව වෙත පැමිණියේ පළාත් පාලන ආයතන ප්‍රධානීන්ගේ රැස්වීමට බැවින් එය පළාත් සභාව මගින් සංවිධානය කළ අතර ඒ සඳහා මන්ත්‍රීවරුන් කිසිවෙකු සඳහා ආරාධනා නොකළ බවයි.

**ගරු නාගරික මන්ත්‍රීනි පී.චන්ද්‍රලතා මැතිතුමා**

සුදර්ශනගම මාර්ගය නඩත්තු කිරීමේ කටයුතු සිදු කළ ද එය 100%ක් සාර්ථක නොමැති අතර නඩත්තු කටයුත්තක් සිදුකිරීමේදී හැකි සෑම විටම සභාපතිතුමා එම ස්ථානය අධීක්ෂණය සඳහා යන්නේ නම් සුදුසු බව පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමිය ගිය වසරේ නගර සභා ප්‍රතිපාදන යටතේ කොට්ඨාශයට දැනෙන්න යමක් කළ නමුත් මෙම වසරේ මාස හතක් ගතවී ගියද එසේ ප්‍රතිපාදන නොලැබුණු බවත් එක් කොට්ඨාශයකට එක් ව්‍යාපෘතියක්වත් ලබා දෙන ලෙසත් සභාපතිතුමාගෙන් ඉල්ලා සිටියේය.

**<u>ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා</u>**

අවමංගල්‍ය උත්සවයක් සඳහා හෝ මංගල උත්සවයක් සඳහා දීම සඳහා මීට පෙර නගර සභාව සතුව හට් හා පුටු තිබූ නමුත් දැනට ඒවා නොපවතින බව පැවසීය. සභාවට බදු ගෙවන ජනතාවට එවැනි සේවාවක් ලබා දීම ඉතා ප්‍රයෝජනවත් වන බවත්, නැති බැරි මිනිසුන් සඳහා එය ඉතා වටිනා බවත් පැවසීය. එම නිසා හට් දෙකක් හා පුටු 100 ක් මිළදී ලබා ගෙන නියමිත ක්‍රමවේදයක් අනුගමනය කරමින් ලබා දිය හැකි බව වැඩිදුරටත් පැවසිය.

එමෙන්ම මහජන පොළ වැසිකිලිය ඉතා අපිරිසිදු තත්වයේ මෙන්ම ඉතා අබලන් තත්වයේ පවතින බැවින් ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස පැවසීය. එමෙන්ම වැසිකිළිය සම්පූර්ණයෙන්ම ආවරණය කර ඇති නිසා කුඩු කාරයන් මෙන්ම පොකට් කාරයන්ට පනින රිලවුන්ට ඉනිමං බැන්දා වැනියැයි පැවසීය.

එහිදී පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා සෑම ප්‍රදේශයකම පවතින සුභසාධන සංගම් සතුව හට් හා පුටු තිබෙන බැවින් එය අනවශ්‍ය වියදමක් බවත් අවශ්‍යනම් සභා ප්‍රතිපාදන නොයොදවා කාගේ හෝ මන්ත්‍රීවරයෙකුගේ මන්ත්‍රී ප්‍රතිපාදන මඟින් ලබා ගත හැකි බව පැවසීය.

**<u>ගරු නාගරික මන්ත්‍රිනි එම්. ශාන්තිලේඛා මැතිතුමිය</u>**

තමන් මෙවර සභාවට ඉදිරිපත් කළ "පුස්තකාලය ඉදිරිපිට නවතා තිබෙන පස් කපන යන්ත්‍රය එම ස්ථානයෙන් ඉවත් කිරීම" යන යෝජනාව පුස්තකාල කමිටුවේදී ලබා ගත් තීරණයක් වන අතර එය මෙවර න්‍යාය පත්‍රයට ඇතුළත් නොකළේ මන්දැයි විමසා සිටියාය.

එමෙන්ම පල්ලෙකුඹුර මාර්ගය කොන්ක්‍රීට් කිරීමේදී මෙටල් වර්ග ආදිය ගොඩ ගසා ඇති නිසා ප්‍රදේශයේ ජනතාවට එය බාධාවක් බැවින් එම මාර්ගය ඉතා ඉක්මනින් අලුත්වැඩියා කරදෙන ලෙස සභාපතිතුමාගෙන් ඉල්ලා සිටියේය.

එමෙන්ම යම් කොට්ඨාසයක සංවර්ධන කටයුත්තක් කරන අවස්ථාවේදී අදාළ කොට්ඨාශයේ මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් අදහස් දක්වමින් පැවසීය.

මෙහිදී පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමා පස් කපන යන්ත්‍රය ඉවත් කිරීම සඳහා සභා තීරණයක් ගත යුතු නොමැති අතර එය න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමෙන් ඒ සඳහා නිකරුණේ කාලය ගතවන බව පැවසීය.

**10. අවසානය**

මෙහිදී අදහස් ඉදිරිපත් කළ ගරු සභාපතිතුමා පුද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම් වලදී සභාවට යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කල නොහැකි වෙනත් ඉල්ලීම් සඳහා අවස්ථාව යොදවා ගනිමින් අවශ්‍ය දේවල් පමණක් කථා කර කාලය කළමනාකරණය කර ගන්නා ලෙස පැවසීය.

අද මේ රට පත්ව තිබෙන තත්වයට සියලු දේශපාලන පක්ෂ වග කිව යුතු අතර රටක් වශයෙන් පොදුවේ තීන්දු තීරණ නොගන්නා දේශපාලන රටාවක් අප රට තුළ දක්නට ඇති බව පැවසීය. එමෙන්ම අපේ රටේ කුමන දේශපාලන පක්ෂය පැමිණියද ඔවුන්ට වැදගත් වන්නේ තම බලය රැක ගනිමින් ඡන්ද පදනම වැඩි කිරීම බව පැවසීය. අපේ රට මෙවන් තත්වයකට පත්ව ඇත්තේ එකමුතුවක් නොමැති බැවින් නිසා සෑම පක්ෂයක් ම එකතු වී රට දියුණු කිරීම උදෙසා පොදු ක්‍රියාමාර්ගයක් ගත යුතු බව පැවසීය.

වැඩිදුරටත් අදහස් දක්වූ ගරු සභාපතිතුමා අපේ රටේ මිනිස්සුන්ගේ චින්තනය වෙනස් කර ඇත්තේ දේශපාලන පක්ෂ මඟින් බවත්, අන් අයගේ අදහස් උදහස් වලට ගරු කළ යුතු අතර මන්ත්‍රීවරුන් සියළු දෙනා නිතර එකතු විය යුතු බවත් පවසමින් අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථකව අවසන් කිරීමට සහයෝගය ලබා දෙමින් සභාවට සම්බන්ධ වූ සියලු දෙනාට ස්තූතිය පුද කල ගරු සභාපතිතුමා ප.ව.03.30 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කළේය.

චමික ජයමිණි විමලසේන,
සභාපති,
බලංගොඩ නගර සභාව.